**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (“අධිකාරිය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 01 හි ඡේද අංක 55 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ මූල්‍ය ආදායම යටතේ නැවත වර්ගීකරණය කර (Reclassified) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ මෙහෙයුම් ආදායම් ලෙස සටහන් වූ රු. මිලියන 37.94 ක පොලී ආදායම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | 2025 මූල්‍ය ප්‍රකාශනවල නිසි හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කරන අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වග බලා ගනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය ප්‍රකාශන අයිතම පිළිබඳව හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම් ස්ථාවර වත්කම් ලෙස සැලකිය යුතු වුවත් අධිකාරියේ මෙහෙයුම් ශිල්පී පුහුණු පාසලෙහි අභ්‍යන්තර විදුලි රැහැන් ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ රු.මිලියන 2.95 ක මුදලින් රු. මිලියන 1.84 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ස්ථාවර වත්කම් රු.මිලියන 1.11 කින් අඩුවෙන් දක්වා තිබුණි. මෙම ප්‍රාග්ධනිත නොකළ වටිනාකමින් රු. මිලියන 1.03ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගොඩනැගිලි අලුත්වැඩියා සහ නඩත්තු ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් වියදම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | මෙම මුදල ප්‍රාග්ධනගත කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අවශ්‍ය නිවැරදි කිරීම් 2025 මූල්‍ය වර්ෂයේදී සිදු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි ව්‍යතිරේඛය ප්‍රකාරව මහා භාණ්ඩාගාරය විසින් 2017 වර්ෂයේ දී ලබා දුන් රු. මිලියන 45.05ක ප්‍රාග්ධන ප්‍රදාන (මෝටර් රථ) හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ සමුච්චිත අතිරික්තය යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දැක්විය යුතු වුවත් එම ප්‍රදානය සමුච්චිත අතිරික්තයට එකතු නොකර මෝටර් රථ ප්‍රදාන ලෙස වෙන්ව දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව සමුච්චිත ලාභය යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස 2025 මූල්‍ය ප්‍රකාශනවල මෙය නිවැරදි කර පෙන්වනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 12 වන ඡේදයට පටහැනිව ටවර්හෝල් රඟහල පදනම වෙතින් 30 අවුරුදු මෙහෙයුම් බදු ගිවිසුමක් යටතේ 2016 වර්ෂයේ දී රු.මිලියන 6 කට ලබා ගත් ඉඩම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත සහ උපකරණ යටතේ දැක්වීමෙන් දේපළ පිරියත සහ උපකරණවල වටිනාකම රු.මිලියන 4.27කින් අධිගණනය වී තිබුණි. | ටවර් හෝල් සම්බන්ධ බදු ගිවිසුම පිළිබඳ වත්කම "Right of Use Asset" ලෙස වාර්තා නොවී තිබීම අධිකාරියේ පවතින හිමිකාරීත්ව ගැටළුවක් මත වූ අතුරුකාලීන ක්‍රියාමාර්ගයකි. එම ගැටළු නිරාකරණය වූ පසු, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 12 ප්‍රකාරව නිවැරදි වර්ගීකරණය සිදු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම ඉඩම භාවිත අයිතිය ඇති වත්කමක් ලෙස ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී රු. මිලියන 1.21 ක් වැය කර ඉදිකිරීම් ආරම්භ කරන ලද "ළිං ජල ප්‍රාග්ධන ව්‍යාපෘතිය" (Well Water Plant) 2023 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන නමුත් එහි පිරිවැය ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද රු.මිලියන 1.21ක් වැය කළ මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කර ඇති බැවින්, ඒ අනුව එය ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය ගැලපුම් 2025 මූල්‍ය වර්ෂයේදී ඊට අදළ තොරතුරු ඇතුළත් ලියවිලි නිසි පරීක්ෂාවකින් පසු සිදු කරනු ඇත. | මේ වනවිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් අදාළ නිවැරදි කිරීම් කර පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | තොග ලැබීම් හා නිකුත් කිරීම් කළමනාකරණය සඳහා විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණු බැවින්, යල්පැනගිය සෙමෙන් චලනයවන හා චලනය නොවන තොග හඳුනා ගැනීමට නොහැකි වූ අතර භෞතිකව නොමැති වටිනාකම රු. මිලියන 7.53 ක ඉන්ධන හා නිල ඇඳුම් තොගයක් තොග ලේඛනයේ දක්වා තිබීම සහ ඇතැම් තොග අයිතමයන් තොග ලේඛනයේ ඇතුළත් කර තිබුණද එහි වටිනාකම් සටහන්ව නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ | ඉන්ධන සහ නිල ඇඳුම් තොග ශේෂයන්හි පවතින රු.මිලියන 7.53 ක වෙනස සම්බන්ධයෙන් සවිස්තරාත්මක සැසඳුමක් සිදු කර ඇත. මෙම වෙනසට ප්‍රධාන හේතු දෙකක් හඳුනාගෙන ඇති අතර ගිණුම් ගැලපුම් සිදු කිරීමට කටයුතු කරමි.<br>ඉදිරියේදී හඳුන්වා දීමට අපේක්ෂිත ඒකාබද්ධ මෘදුකාංග පද්ධතියට (ERP SYSTEM) තුළ අදාළ සියලු ගුණාංග අන්තර් ගත කිරීමට අවශ්‍ය පියවර මේවන විටත් ගෙන ඇත. | තොග ශේෂයන්හි පවතින වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට සහ ERP පද්ධතිය ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

ඇතුළත් රු.මිලියන 139.70 ක තොග වටිනාකමෙහි නිවැරදිතාවය විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් වර්ෂය අවසානයේ දී අධිකාරියේ විවිධ ණයහිමියන්ගේ වටිනාකම රු.මිලියන 4.43 ක් වු අතර ඉන් රු.මිලියන 3.29 ක ශේෂයන් වසර දහයකට අධික කාලයක් සිට නිරවුල් කර නොතිබුණි. | මෙම මුදල වසර දහයකට අධික කාලයක් සිට නිරවුල් නොකිරීමට ප්‍රධාන හේතුව වන්නේ අදාළ සේවකයන් අධිකාරියෙන් ඉවත්ව ගියද ඔවුන්ගේ ඉවත්වීම් ක්‍රියාවලිය නිසි ලෙස සම්පූර්ණ නොකිරීමයි. | ගෙවිය යුතු ශේෂයන් කාලීනව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) වගන්තිය | සේවය අවසන් වී දින 30 ක් ඇතුළත පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව නිලධාරීන් තිදෙනෙකු සඳහා ප්‍රමාද වී පාරිතෝෂික ගෙවීම හේතුවෙන් රු.මිලියන 0.29 ක අධිභාර මුදලක් ගෙවීමට අධිකාරියට සිදු වී තිබුණි. | පිළිගෙන ඇත. | සේවය අවසන් වී දින 30 ක් ඇතුළත අදාළ නිලධාරීන්ට පාරිතෝෂික මුදල් ගෙවීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාද වීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම හා අධිකාරියට සිදු වූ පාඩු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් මෙහෙයුම් අත්පොතේ 3.5 හා 6.8 වගන්ති | අධිකාරිය සතු වාහන දෙකක් 2023 වර්ෂයේ දී නිසි අනුමැතියකින් තොරව අමාත්‍යාංශයේ කටයුතු සඳහා මුදාහැර තිබුණු අතර එම වාහනවල රියදුරන්ට ගෙවූ වැටුප්, දීමනා හා ඉන්ධන වශයෙන් වැයකර තිබුණු මුදල් ද අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම අධිකාරියේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රියාකරු තනතුරේ සේවකයකු 2007 මැයි මාසයේ සිට අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයට මුදාහැර තිබුණු අතර ඔහුට ගෙවා තිබුණු වැටුප්, දීමනා හා අතිකාල මුදල් ද අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | රියදුරුගේ ගමන් වියදම් හා යැපීම් දීමනා සහ අතිකාල දීමනා අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කර දෙන ලෙස සිහිකැඳවීම් ලිපි යවා ඇතත් එම වියදම් ප්‍රතිපූර්ණය වී නොමැත. ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රියාකරු වැටුප් හා අනෙකුත් දීමනා සඳහා වැයවන මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කර දෙන ලෙස ඉල්ලීම් කරමින් අමාත්‍යාංශ ලේකම් වෙත ලිපි ගණනාවක් යොමු කළ ද අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීමක් සිදු වී නොමැත. | අදාළ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතු අතර අධිකාරියේ සම්පත් වෙනත් ආයතන වෙත මුදා හැරීමේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1992 ජනවාරි 25 දිනැති 03/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවයට වාර්තා කළ යුතු වේලාවට පසු ප්‍රමාද වී පැමිණීම් ආවරණය කළයුතු වුවද ඇතැම් සේවකයන් ප්‍රමාද වීම් ආවරණය කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් නිවාඩු අඩුකිරීමට ද කටයුතු කර නොතිබුණි. | අනුමත චක්‍රලේඛ අනුව ප්‍රමාද සහන අවස්ථා ඉක්මවා සේවයට වාර්තා කරන අයගේ එම ප්‍රමාදයන් ඔවුන්ගේ කෙටි නිවාඩුවලින් අඩුකර ගන්නා අතර ඒවාද අවසන් වූ පසු හිමි නිවාඩුවලින් අඩු කර ගැනීම කරනු ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ආවරණය නොකළ ප්‍රමාද වීම් නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2009 අප්‍රියෙල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවද දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් 08 දෙනෙකු එසේ කර නොතිබුණි. | එක් දිස්ත්‍රික්කයක් සඳහා එක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියෙක් පමණක් පත්කර ඇති බැවින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාර්යාල ස්ථාපනය කර නොමැති අතර ඒ අනුව මෙම නිලධාරින්ගේ පැමිණීම/පිටවීම වාර්තා සහතික කර ගැනීම සිදුකර ගනු ලබන්නේ එම නිලධාරීන් හට කාර්යාල පහසුකම් සලසා දී ඇති වෙනත් රජයේ ආයතන මඟින් වනු ඇත. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ පැමිණීම/ පිටවීම අදාළ රාජ්‍ය ආයතනයන්හී ඇඟිළි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් ලබා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 66.63 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 26.88 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 39.75 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වසරට සාපේක්ෂව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පුහුණු පාඨමාලා ආදායම රු.මිලියන 9.65 කින් ද, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ආදායම රු.මිලියන 22.54 කින් හා පුහුණු පාඨමාලා ආදායම රු.මිලියන 10.48 කින් ද වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | ප්‍රවර්ථන වර්ෂයේ වටිනාකම (රු.මිලියන) | ඉකුත් වර්ෂයේ වටිනාකම (රු.මිලියන) | වෙනස වැඩිවීම/(අඩුවීම) (රු.මිලියන) | වෙනසේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| මෙහෙයුම් ආදායම් | 337.18 | 291.69 | 45.49 | 16 |
| මෙහෙයුම් නොවන ආදායම් | 5.43 | 11.1 | (5.68) | (51) |
| රජයේ ප්‍රදාන සහ අග්‍රිම | 168.71 | 162.41 | 6.3 | 4 |
| **වියදම්** | | | | |
| ව්‍යාපෘති මෙහෙයුම් වියදම් | 35.31 | 67.54 | (32.23) | (48) |
| පරිපාලන වියදම් | 229.55 | 203.58 | 25.97 | 13 |
| නඩත්තු වියදම් | 78.17 | 77.58 | 0.59 | 1 |
| පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු වියදම් | 33.11 | 32.09 | 1.02 | 0 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 4:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ දී එය 3:1 ක් විය. අධිකාරියේ ක්ෂණික වත්කම් අනුපාතය පසුගිය වර්ෂයේ සියයට 2:1ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය 3:1 ක් දක්වා වැඩි වී තිබුණි. තවද වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය පසුගිය වර්ෂයේ සියයට 2 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 5 ක් දක්වා වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අතිරික්තය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 148කින් ඉහළ යාම වත්කම් මත ප්‍රතිලාභ අනුපාතයේ මෙම ඉහළ යාමට මූලික වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් අධ්‍යක්ෂකගේ සේවය අවසන් කිරීමට විරුද්ධව ඔහු විසින් අධිකාරියට එරෙහිව ගොනු කළ නඩුවේදී හිඟ වැටුප් ගෙවා ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙස තීන්දුව ලබාදුන්නද එම තීන්දුව ක්‍රියාත්මක නොකර ඒ සම්බන්ධ අභියාචනයක් අධිකාරිය විසින් ගොනුකර ඒ වෙනුවෙන් රු.1,750,000 ක වියදමක් දරා තිබුණි. පසුව එම නඩුව | තව දුරටත් මෙම අභියාචනය ඉදිරියට ගෙන යාමට අවශ්‍යතාවයක් නොවූ හෙයින් අප ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි මෙම අභියාචනා නඩුව ඉල්ලා අස් කර ගන්නා ලදී. මෙම අභියාචනය ගොනු කරන අවස්ථාවේදී මෙවැනි තත්වයක් | වැරදි කළමනාකරණ තීරණවලට හේතු වූ කරුණු සොයා බලා ඉදිරියේදී අනාර්ථික වියදම් වළක්වා ගැනීමට හා වගකිව යුතු පාර්ශවයන්ගෙන් මෙම මුදල් නැවත අය කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| අධිකාරිය විසින්ම 2024 වර්ෂයේදී ඉවත් කරගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් දරන ලද වියදම අනාර්ථික වියදමක් විය. | උද්ගත වේ යැයි පුරෝකථනය කළ නොහැකි බව අවධාරණය කරනු ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක්වන අතර අධිකාරිය විසින් ඒ තුළ ඉදිකරන ලද ගොඩනැගිලිවල පිරිවැය රු.මිලියන 306.15 ක් විය. මෙම ඉඩම සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුමකට එළඹීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. එසේම ගල්කුලම පිහිටි අධිකාරියේ මෙහෙයුම් ශිල්පී පුහුණු පාසල (OTC) හා කතරගම සංචාරක බංගලාව පිහිටි ඉඩම් සඳහා ද අදාළ පාර්ශවයන් සමග මෙතෙක් නිශ්චිත බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියෙන් දිගුකාලීන බදු පදනම මත ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිසි අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව කටයුතු කරනු ලැබේ.<br>ගල්කුලම පිහිටි ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගැනීමට අවශ්‍ය දිව්රුම් ප්‍රකාශ නිසි ලෙස අත්සන් කර තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී ඇත.<br>කතරගම පිහිටි සංචාරක බංගලාව පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක්වන අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිසි අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව අප ආයතනය සමඟ දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළඹීමට හැකි වනු ඇත. | අදාළ දේපළ සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුම්වලට එළඹීම සහ ගිවිසුමේ වගන්ති වලට අනුකූලව කටයුතු කිරීම නොපමාව සිදු කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු විදුහලේ (OTC) යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රජය 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 163.37 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයට යොමුකරන නිපුණ ශිල්පීන් ප්‍රමාණය 1000 ඉක්මවීමට බලාපොරොත්තු වුවද 2024 වර්ෂයේ පුහුණු පාඨමාලා 10 ක් මඟින් නිපුණ ශිල්පීන් 577 ක් පමණක් බිහි කර තිබුණි. ඒ අනුව රජය විසින් අවශ්‍ය පහසුකම් සපයා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි. තවද සැලසුම් කර තිබුණු පුහුණු වැඩ සටහන් 11 ක් පමණ වර්ෂ කිහිපයක සිටම පවත්වා නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇතැම් පුහුණු වැඩසටහන් සඳහා ලද ආදායම මෙන්ම සහභාගී වූ පිරිසද අඩු මට්ටමක | 2020 -2022 වසර කිහිපය තුළ පැවති වසංගත තත්ත්වයන් හා ආර්ථික අර්බුදය හමුවේ භෞතික පුහුණු කිරීම් සීමා කිරීමට සිදුවීමත් ඉන්ධන ඇතුළු භාණ්ඩ හා අමතර කොටස්වල මිල ඉතා ඉහළ යාම තුළින් පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීමට සිදුවීමත් නිසා ආධුනික පුහුණු කිරීම් අඩුවී ඇත. නමුත් ඉලක්ක ගත කළ පරිදි වෘත්තීය විෂය ධාරාව සාර්ථකව සිදුකිරීමටත් විශ්ව විද්‍යාල සිසුන් සඳහා පාඨමාලා නිර්මාණය කිරීමත් තුළින් 2024 වසර වන විට 1017 ක පිරිසක් සඳහා පුහුණුව ලබාදීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබූ සාර්ථක ප්‍රතිඵලයක් වී ඇත. | අරමුණු ගත කාර්යයන් ක්‍රියාකාරී සැලැස්ම අනුව සාර්ථකව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවතුණි. ඒ අනුව ඇතැම් පාඨමාලාවන් පැවැත්වීමෙන් වියදම ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ද ලැබී නොතිබුණි. | | |
| (ඈ) | අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වහල අලුත්වැඩියාව සඳහා 2022 වර්ෂයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවන පරිදි කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඇස්තමේන්තුවේ දක්වා තිබූ ඇතැම් වැඩ කොටස් ඉවත් කර හා ඇතැම් වැඩ කොටස් අඩු කර එසේම වැඩි රේටයන් යටතේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 5.6 ක මුදලකට භාරගෙන තිබුණි. 2023 ජූනි 27 දින අදාළ කාර්යය නිම කිරීමෙන් පසු ස්ථාන කිහිපයකින් ගොඩනැගිල්ල තුළට වැසි ජලය කාන්දුවන බව හා සිවිලිමේ ඇතැම් කොටස් කඩා වැටීම සහ ඇතැම් කොටස් අසම්පූර්ණ බව නිරීක්ෂණය වුවද දෝෂ නිවැරදි කිරීමේ කාලයත් අවසන්ව 2025 අප්‍රියෙල් 30 දිනවන විටත් එම අඩුපාඩු සකස් කර ගැනීමට අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි. | සිඩා වෙබ් අඩවියේ දැන්වීමක් පලකර C-6 ලියාපදිංචි ඉදිකිරීම් ආයතනයක් තෝරාගෙන රු.මිලියන 5.59 මුදලකට අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් පමණක් සිදු කර 2023 ජූනි 27 වන දින මෙම කොන්ත්‍රාත්තුව අවසන් කර භාර දී ඇති අතර ඒ සඳහා අදාළ ගෙවීම් කටයුතු ද සිදු කර ඇත.<br>ගිවිසුමට අනුව නඩත්තු කාල සීමාව මේවන විට අවසන් වී ඇති අතර ඉහත සඳහන් දෝෂ නිවැරදි කර නොමැති බැවින් මුළු කොන්ත්‍රාත් මුදලේ උපරිම රඳවා ගැනීමේ මුදල මේවන තෙක් ආයතනය විසින් ගෙවීම් කර නොමැත. | අලුත්වැඩියාව සම්බන්ධයෙන් පවතින අඩුපාඩු කඩිනමින් සකස් කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | අධිකාරිය සතු ජල බවුසරයක් 2020 ජූලි 20 දින හදිසි අනතුරකට ලක් වී තිබුණු අතර රථය අලුත්වැඩියා කර ගැනීම සඳහා රු.මිලියන 2.58 ක වියදමක් දරා තිබුණද රක්ෂණ සංස්ථාවෙන් වන්දි ලෙස අලුත්වැඩියා වියදමින් සියයට 50 ක් එනම් රු. මිලියන 1.29 ක් පමණක් 2023 ජූලි 14 දින ගෙවා තිබුනි. ඒ අනුව ඉතිරි මුදල 2025 පෙබරවාරි 28 දිනවන විටත් රක්ෂණ සංස්ථාවෙන් ලබා ගත නොහැකි වී තිබුණි. | 2025 අප්‍රේල් 29 දින සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මැදිහත්වීම නැවත ඉල්ලා 2025 මැයි 16 දින ලිපියක් යොමු කොට ඇත. ඊට අමතරව සම්පූර්ණ වන්දි මුදල ගෙවීමට මුලින් අනුමැතිය ලබා දී පසුව ඉන් කොටසක් පමණක් ලබා දීම සලකා මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබාගැනීමට ලිපි යොමු කර ඇත. | රක්ෂණයෙන් මෙතෙක් ප්‍රතිපූර්ණය කරගත නොහැකි වූ මුදල නැවත ලබා ගැනීමට සහ ඉදිරියේ දී මෙවැනි වන්දි මුදල් කාලීනව ලබා ගැනීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 35.77 ක මුදලක් ලබා දී තිබුණි. මීට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපනය සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත රු.මිලියන 0.83 ක මුදලක් ගෙවා තිබුණද මීට අදාළ පද්ධති සංවර්ධන | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් නිම කරන ලද මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිකිරීම් ශිල්පී ලියාපදිංචිය සඳහා සකස් කරන ලද මෘදුකාංග පද්ධතියේ ඇති වූ ප්‍රායෝගික ගැටලු පිළිබඳ ව සලකා බලා ඒවා නිරාකරණය කොට නැවත සකස් කරන ලද මෘදුකාංග පද්ධතිය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) | නිපුණ ශිල්පීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අදාළ රීති හා ශාස්ත්‍ර කඩිනමින් සකස්කර ගැසට් පත්‍රයේ පළ |

| | | | |
|---|---|---|---|
| | කටයුතු 2025 අප්‍රේල් 30 දින දක්වා අවසන් කර නොතිබුණි. තවද නිපුණ ශිල්පීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට පෙර ඊට අදාළ රීති හා ගාස්තු ගැසට් පත්‍රයේ පළකර ඉන් පසුව අදාළ ගාස්තු අයකර ගැනීම නෛතික තත්ත්වය වුවද අධිකාරිය විසින් මේ දක්වා ඊට අදාළ රීති හා ගාස්තු ගැසට් කිරීමකින් තොරව මේ සඳහා අයදුම්පත් කැඳවා ඔවුන්ගෙන් ගාස්තු අයකර තිබුණි. මෙසේ ගාස්තු අයකර සමාලෝචිත වර්ෂය අවසානවන විට හැඳුනුම්පත් 824 ක් නිකුත්කර තිබුණි. | වෙත ලබා දී ඇත. 2025 මැයි 29 දින සිට සම්පූර්ණයෙන්ම ශිල්පීන් සඳහා භාවිතයට යෙදවීමට නියමිතය.<br>මේ සඳහා අවශ්‍ය නීතිමය බලය 2014 අංක 33 දරන ඉදිකිරීම් සංවර්ධන පනතේ 48 හා 49 වගන්තිවලින් ලැබී ඇති අතර අදාළ නියෝග (Regulations) මේවන විටත් ගැසට් කොට ඇත. තවද අදාළ නීති (Rules) සැකසීමේ කටයුතු නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන අතර අවසාන අදියරේ පවතී. 2021<br>එහි පවතින මිලගණන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද සහිතව ලියාපදිංචිය හා හැඳුනුම්පත් නිකුත් කිරීම සිදුකෙරෙමින් පවතී. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අධිකාරියේ කාර්යයන් දීප ව්‍යාප්තව කරගෙන යාම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාර්යාල 14 ක් ක්‍රියාත්මකවන අතර සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැළැස්මට අනුව එම කාර්යාලයන්හි ලඟාකර ගත යුතු ඉලක්කයන්, ලඟාකර ගත යුතු කාලය සහ කාර්යය සාධන දර්ශකයන් නිශ්චිතව දක්වා නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලයන් හි කාර්යයසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. එසේම මෙම නිලධාරීන්ගේ කාර්යසාධනය වෙනුවෙන් නිසි මඟපෙන්වීමක් සහිත සම්බන්ධීකරණයක් අදාළ අංශ මඟින් සිදු වී නොතිබුණි.<br>මෙම ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදුකරන ඇතැම් කාර්යයන් මාර්ගගතව සිදුකිරීමට හැකියාව පවතින බවට විගණයේදී නිරීක්ෂණය වූ අතර ජනවාරි සිට ජූනි දක්වා වැඩබිම් පරීක්ෂාව දිස්ත්‍රික්ක 06 ක සිදුකර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | ප්‍රාදේශීය කාර්යාලයන්හි කාර්යයසාධනය කාලීනව පරීක්ෂා කිරීමට හැකි අයුරින් ඉලක්කයන් හා කාර්යසාධන දර්ශකයන් නිශ්චිතව හඳුන්වා දී ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (උ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා කතරගම සංචාරක බංගලාව සම්බන්ධයෙන් වෙන්කිරීම් (Reservation) 57 ක් පමණක් සිදුකර ඇති අතර සංචාරක බංගලාව පවත්වාගෙන යාමෙන් රු.මිලියන 0.98 ක අලාභයක් ලබා තිබුණි. | 2025 පෙබරවාරි 27 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී ලබා ගත් තීරණයට අනුව 2025 මාර්තු 05 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මකවන පරිදි සංචාරක බංගලාවේ නවාතැන් පහසුකම් සඳහා වෙන් කිරීම් සිදු කිරීම නතර කරන ලදී. මෙය අළුත්වැඩියා කළ යුතු මට්ටමේ පවතින පැරණි ගොඩනැගිල්ලක් බැවින් මෙය අළුත්වැඩියාව සඳහා ඊට විශාල මුදලක් වැය වීම සැලකිල්ලට ගෙන කළමනාකරණ මණ්ඩල අනුමැතිය ඇතිව | කතරගම සංචාරක නිකේතනය ලාභදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කර නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |

ටෙන්ඩර් කැඳවීම මඟින් බාහිර පාර්ශවයකට සංචාරක නිකේතනය පවත්වාගෙන යාමට ලබා දීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් අතරින් පනතේ 33 වගන්තියට අනුව විදේශීය උපදේශකවරුන් අධිකාරියේ ලියාපදිංචි වීම සඳහා ලියාපදිංචි වීමේ ක්‍රියා පටිපාටි නියම කිරීම, පනතේ 51 වන ඡේදය ප්‍රකාර කාර්මික ආරවුල් තීරකකරණයට අදාළ ක්‍රියාපටිපාටි සකස් කිරීම සහ පනතේ 55 වන වගන්තියට අනුව තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර එහි කර්තව්‍ය හා කාර්යය පටිපාටි සහ කාර්යය සාධන ප්‍රමිති නියම කිරීම යන කාර්යයන් ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. එසේම, උක්ත පනතේ 46 වගන්තිය පරිදි අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛන (Standard Bidding Documents) පිළියෙල කළ යුතු වුවද, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් පිළියෙල කර තිබුණු ලංසු ලේඛන SBD – 03 (ප්‍රසම්පාදන - වැඩ - Minor), SBD – 02 (ප්‍රසම්පාදන - වැඩ - Major), SBD - 04 (Design and Build) මෙතෙක් සංශෝධනය කර නොතිබුණි. | විදේශීය උපදේශකවරයන් සුදුසුකම්ලත් තැනැත්තන් ලෙස ලියාපදිංචියට අදාළ රෙගුලාසි සකස් කර ඇත. තීරකකරණය (Adjudication) පිළිබඳ ක්‍රියාපටිපාටිය සකස් කර ඇති අතර 2017 නොවැම්බර් 28 දින අමාත්‍යාංශයට හා නීති කෙටුම්පත් සම්පාදක වෙත ප්‍රථම වරට ඉදිරිපත් කර ඇත. තොරතුරු ලේකම් කාර්යාලයේ පිහිටුවීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ කටයුතුවලින් වගන්ති 55 (a) දියත් කිරීමට අවශ්‍ය කටයුතු නිම කොට දත්ත ලබා දීමට සියළුම බැංකුවලට යවා ඇත. තවද, ලංකාවේ සියලුම ව්‍යාපෘතිවල දත්ත එකතු කිරීමට අදාළව රාජ්‍ය ආයතනවලට දත්ත උඩුගත කිරීමට අවශ්‍ය සබැඳිය අමාත්‍යාංශය හරහා යවා ඇත. SBD 03 ලේඛන අදාළ වෙනස්කම් සිදු කොට ඇති අතර 2025 කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතය. මේවන විට SBD 02 සහ SBD 04 ට අදාළ සංශෝධනයන් සිදු කරමින් පවතී. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මෙහි ප්‍රගතිය පරීක්ෂාවේ දී දේපළ සංවර්ධනකරුවන් ලියාපදිංචිය, ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නන් ලියාපදිංචිය, සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචිය, ඉදිකිරීම් ස්ථානවල සෞඛ්‍ය සහ ආරක්ෂක තත්ත්ව කළමනාකරණය ආදිය නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂණ කණ්ඩායම් යැවීම, හරිත ගොඩනැගිලි සපයන්නන් ලියාපදිංචිය, වැඩබිම් සුපරීක්ෂකවරුන් හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් ලියාපදිංචිය, විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය, තාක්ෂණික විගණනයන් | මෙම ලියාපදිංචි කිරීමේ මූලපිරීම ශක්තිමත් කිරීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර, ඔවුන් අධිකාරියේ ලියාපදිංචිය ඔවුන්ගේ ගොඩනැගිලි අනුමත කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කිරීමට එකඟ වී ඇත. මෙම උපායමාර්ගික සහයෝගීතාවය තුළින් ලියාපදිංචියේ වටිනාකම වැඩි දියුණු කිරීමට සහ අනාගතයේදී දේපල සංවර්ධකයින්ගේ වැඩි සහභාගීත්වයක් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ ලේඛනය අධිකාරියේ වෙබ් අඩවියෙන් ලබා ගත | විධිමත් සැලසුම් හා ඉලක්ක සකස් කර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. |

| | | |
|---|---|---|
| සිදු කිරීම, අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලය ආවරණයවන පරිදි දේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම, සුපරීක්ෂණ මට්ටමේ කළමනාකරුවන් සහ වෘත්තීය මට්ටමේ වෙනත් නිලධාරීන් පුහුණු කිරීම, ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන් යන කාර්යයන් හි සමාලෝචිත වර්ෂය තුළදී කාර්යය සාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | හැකිය. අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන් වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්ට ඇතුළත් කරන ලෙස ඉල්ලා බොහෝ රජයේ ආයතන වෙත දැනුම් දී ඇත. අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමට රජයේ ආයතනවලට උපදෙස් දී ඇති අතර අදාළ දිස්ත්‍රික්ක පුරා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් (DCO) හරහා ප්‍රවර්ධන කටයුතු සිදු කර ඇත.<br>විදේශීය සමාගම් ලියාපදිංචි කිරීම සඳහාවන නියාමනයේ අවසාන කෙටුම්පත දැන් කළමනාකරණ මණ්ඩලයට අනුමැතිය සඳහා විධිමත් ලෙස නැවත ඉදිරිපත් කිරීමට සූදානම්ය.<br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් (DCOs) සහ ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලයෙන් සමන්විත නිරීක්ෂණ කණ්ඩායමම, අහඹු පදනමක් මත වැඩබිම නිරීක්ෂණයට පැමිණෙන අතර, අපේක්ෂිත ස්ථාන චාරිකා සංඛ්‍යාව පවත්වා ගැනීමේදී අභියෝගවලට මුහුණ දී ඇත. | |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ටවර් හෝල් රඟහල පදනමට අයිති ඉඩමක අධිකාරිය පවත්වාගෙන යන අතර ඒ සඳහා දෙපාර්ශවය විසින් 2016 වර්ෂයේදී අත්සන් කළ රු.මිලියන 6ක බදු ගිවිසුම පැරණි බදු ගිවිසුමේ වටිනාකමටම සමාන වූ බැවින් කුලී මුදල සංශෝධනය නොවීම සම්බන්ධයෙන් බදු හිමියා විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දුන් අනුමැතිය මත ටවර් හෝල් රඟහල පදනම වෙත රු.මිලියන 145 ක් (ගණනය කරන ලද ආකාරය පැහැදිලි නොකරන ලද) ගෙවීමට අධිකාරියට සිදු වී තිබුණි. දැනට පවතින බදු ගිවිසුම අවලංගු කිරීම, සංශෝධනය කිරීම හෝ නව ගිවිසුමකට එළඹීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉන් රු. මිලියන 25 ක අත්තිකාරම් මුදලක් 2024 සැප්තැම්බර් 06 දින ගෙවා තිබීම විගණනයේදී ගැටලුකාරී තත්ත්වයක් බව නිරීක්ෂණය විය. | ටවර්හෝල් රඟහල පදනම සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය අතර නව බදු ගිවිසුමෙහි කුලී වටිනාකම සංශෝධනය කිරීමට දෙපාර්ශවය විසින් එකඟතාවයකට පැමිණ නොමැත. කෙසේ වුවද 2024.07.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට ගරු කිරීම සඳහා (එම තීරණයට අප ආයතනය එකඟ නොවේ නම් නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් එය වෙනස් කර ගැනීමට යටත්ව) මෙලෙස රුපියල් මිලියන 25 ක අත්තිකාරම් මුදලක් අප ආයතනය විසින් ටවර්හෝල් රඟහල පදනම වෙත ගෙවා ඇත. | දෙපාර්ශවයේ එකඟතාවය මත නිවැරදි හා සාධාරණ බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර එහි වගන්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගල්කුලම OTC හි පුහුණු කටයුතු සඳහා භාවිතා කළ උපකරණ බොහෝමයක් අක්‍රිය තත්ත්වයේ පවතින අතර එම උපකරණ විවිධ ස්ථානවල ගාල් කර තිබීම නිසා විශාල ඉඩකඩක් වෙන් වී තිබුණි. ගර්හිත තත්ත්වයේ පවතින යන්ත්‍ර උපකරණ හා වාහන 11 ක් පමණ අපහරණය කිරීමට හා තවත් යන්ත්‍ර උපකරණ හා වාහන 11 ක් අලුත්වැඩියා කිරීමට ද පියවර ගෙන නොතිබුණු අතර 2017 වර්ෂයේ රු.මිලියන 7.9 ක් වියදම් කර පුහුණු වැඩසටහන් සඳහා භාවිතා කිරීමට මිලදී ගෙන තිබුණු සිමියුලේටර් යන්ත්‍රය 2023 වර්ෂයේ මාර්තු මාසයේ සිට ක්‍රියාවිරහිත වී තිබුණු අතර යන්ත්‍රය වර්ෂ දෙකකට ආසන්න කාලයක් අලුත්වැඩියා කිරීමෙන් තොරව නිශ්ක්‍රියව පැවතුණි. | තාක්ෂණික දෝෂයක් හේතුවෙන් යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා යොමු කෙරුණි. නමුත් මෙම යන්ත්‍ර අවශ්‍යතාවය හා ඇණවුම මත නිශ්පාදනය කරනු ලබන භාණ්ඩවන බැවින් සාමාන්‍ය වෙළඳපොලේ අලුත්වැඩියා කිරීමට නොහැකිය. අදාළ මෘදුකාංග හා දෘඩාංග පද්ධතින්හි කොටස් මෙරට වෙළඳපොලේ සොයාගැනීමට අපහසු වීම හේතුවෙන් අලුත්වැඩියාව සඳහා යම් කොටස් චීන මව් සමාගම වෙත යොමුකරන ලද අතර මෙම තාක්ෂණික ක්‍රියාවලින් අවසන්වීම වෙනුවෙන් සැලකිය යුතු කාලයක් ගතවිය. මේවන විට අදාළ මෘදුකාංග හා දෘඩාංග පද්ධතින් හි කොටස් අලුත්වැඩියාවෙන් අනතුරුව ආයතනය වෙත ලැබී ඇති අතර අලුත්වැඩියාව අවසන් අදියරෙහි පවතී. | අක්‍රිය තත්ත්වයේ පවතින යන්ත්‍ර උපකරණ හා වාහන අලුත්වැඩියා කිරීමට හෝ එසේ අළුත්වැඩියා කළ නොහැකි වත්කම් අපහරණය කිරීමට නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගල්කුලම පිහිටි මෙහෙයුම් ශිල්පී පුහුණු පාසැලේ සම්පත්දායකයින්ට නවාතැන් ගැනීම සඳහා රු.මිලියන 23.56 ක වියදමින් ගොඩනැගිල්ලක් 2020 වර්ෂයේ දී ඉදිකර තිබුණද මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත ගොඩනැගිලි සැලසුම ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එසේම ගොඩනැගිල්ල ඉදිකර පදිංචියට සුදුසු බවට අනුකූලතා සහතිකයද ගෙන නොතිබුණි. තවද මෙම ගොඩනැගිල්ල වනගහනය සහිත වන සතුන් ගැවසෙන ස්ථානයක ඉදිකර තිබුණ අතර ඒ සඳහා වනජීවී, වන සංරක්ෂණ හා පරිසර ඇතුළු ආයතනවලින් අදාළ අනුමැතීන්ද ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම ගොඩනැගිල්ලේ උපයෝජනයද ඉතා අඩු මට්ටමක පැවතුණි. | ගොඩනැගිලි සැලසුම් වනජීවී ආයතනය ඇතුළුව UDA අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අනතුරුව ඉතිරි අනුකූලතා සහතික ලබා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ඇත. | මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් අදාළ අනුමැතීන් ලබා ගැනීමට සහ ගොඩනැගිල්ල ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිමියුලේටරයක් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම් යටතේ පුවත්පත් දැන්වීමක් පළකර තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව දින 21 ක කාලයක් ලබා දිය යුතු වුවද, ඊට පටහැනිව ප්‍රමාණවත් කාලයක් ලබා නොදී දින 12 ක් පමණක් ලබාදීම හේතුවෙන් එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලැබී තිබුණි. එහි මිල වැඩි බැවින් හා ලංසුකරුවන් සීමා වී තිබුණු බැවින් නැවතත් මිලගණන් කැඳවීමට සිදු වී තිබුණි. ඒ අනුව දැන්වීම සඳහා වැයකළ මුදල ද නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | සිමියුලේටර් බහුලව භාවිතාවන හෝ නිෂ්පාදනය කරන භාණ්ඩයක් නොවන හෙයින් සැපයුම්කරුවන් ඉතාමත් සීමිත වේ. මේ නිසා ලංසුකරුවන් අඩු වුවද ලංසු භාර ගැනීමට පූර්ව රැස්වීම් පවත්වා ඇති හෙයින් කාලය ප්‍රමාණවත් නොවේ නම් ඒ සඳහා ලංසුකරුවන්ට ඉල්ලීම් කළ හැකිව තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව මිලදී ගැනීම් සිදු කිරීමේ දී ලංසු ඉදිරිපත් කිරීම සඳහාවන නියමිත කාලය ලබා දීමෙන් තරඟකාරීත්වය වැඩි කර වඩාත් වාසිදායක ලංසුව තෝරා ගැනීමට අවස්ථාව ලබා නොදීමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු අතර ප්‍රසම්පාදන පද්ධතිය කාර්යක්ෂම හා ඵලදායී කිරීමටද කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බඳවාගැනීමේ පරිපාටිය (SOR) අනුව සහකාර අධ්‍යක්ෂ තනතුරේ වර්ෂ 10 ක් හා අනෙකුත් කරුණු සම්පූර්ණ වූ නිලධාරියෙකු වෙත නියෝජ්‍ය අධ්‍යක්ෂ MM 1-1 ශ්‍රේණිය ලබා දිය හැකි වුවද එම තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කළ නිලධාරියෙකු වෙත එම දිනයේ සිට පෙරදාතම් කර උසස්වීම ලබා දී තිබුණු බැවින් ඔහුට වැඩි වැටුපක් ගෙවීමට සිදුවීම මෙන්ම පුරප්පාඩු වූ අධ්‍යක්ෂක තනතුරු සඳහා අයදුම් කිරීමේදී අනෙකුත් අයදුම්කරුවන්ට අසාධාරණයක් සිදුවීමට අවස්ථාව පවතින බවද නිරීක්ෂණය විය. | මධ්‍යම කළමනාකරු (MM 1-1) සේවා කාණ්ඩයේ සහකාර අධ්‍යක්ෂ II ශ්‍රේණියේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ I ශ්‍රේණියට උසස් කිරීම, එම උසස්වීම ක්‍රියාත්මකවන දිනය හා හිඟ වැටුප් වර්ධක ගෙවීම් සම්බන්ධයෙන් අංක 1/4/107-II (1015) දරන 2024 මාර්තු 10 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | බඳවාගැනීම් පරිපාටියේ සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් සඳහා අදාළ නීතිරීතිවලට අනුකූලව උසස්වීම් ලබාදීම සිදු කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට අනුමත, කාර්යය මණ්ඩලය පිළිවෙලින් 390ක් හා 196ක් වූ බැවින් එදිනට අධිකාරියේ 194ක පුරප්පාඩු පැවතුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 17 ක පුරප්පාඩු පවතින අතර අධ්‍යක්ෂක (මුදල්) හා අධ්‍යක්ෂක (සංවර්ධන) තනතුරුද පිළිවෙලින් වසර 2ක හා වසරක සිට පුරප්පාඩුව තිබුණි. | රජයේ බඳවා ගැනීම් සීමා කර ඇති බැවින් අධිකාරියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් නවතා තිබුණු අතර බඳවාගැනීම් පටිපාටියේ සංශෝධනයක් සහ තනතුරු සංඛ්‍යාව සංශෝධනයක් සඳහා | බඳවාගැනීමට අදාළ අනුමැතීන් කඩිනමින් ලබා ගෙන අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | |
| (ඇ) | 2021 ඔක්තෝබර් 08 දින එවකට අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) අනිවාර්යය නිවාඩු යැවීමට එරෙහිව එම නිළධාරියා විසින් නෛතික ක්‍රියාමාර්ගවලට යොමුව තිබුණු අතර ඒ සම්බන්ධයෙන්වන නඩු පහකට අදාළව 2025 අගෝස්තුවන විට අධිකාරිය විසින් රු.මිලියන 15.01 ක නෛතික වියදමක් දරා තිබුණි. අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව යටතේ හිටපු අධ්‍යක්ෂ (මුදල්) විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව ගොනු කළ නඩුව වෙනුවෙන් දරන ලද රු.මිලියන 10.8 ක් ද ඒ තුළ ඇතුලත්ව තිබුණු අතර එය මේ දක්වා අවසන් වී නොතිබුණි. | හිටපු අධ්‍යක්ෂ (මුදල්) විසින් අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව යටතේ ගොනු කරන ලද නඩුව අවසන්වන දිනය පිළිබඳව පුරෝකථනය කළ නොහැකි බව සඳහන් කරන අතර ගරු නීතිපති තුමන් විසින් අධ්‍යක්ෂ (මුදල්) ගේ මූලික නඩුවට පෙනී සිටීම ප්‍රතික්ෂේප කළ පසු අධ්‍යක්ෂ (මුදල්) සම්බන්ධ අනිත් නඩු සඳහාද අප ආයතනය විසින් පුද්ගලික නීතිඥවරුන්ගේ සහය ලබා ගැනීමට තීරණය කර ඇත. | නිවැරදි පරිපාලන තීරණ නොගැනීම මත හා දුර්වල මානව සම්පත් කළමනාකරණය තුළින් අධිකාරියට දැරීමට සිදු වූ මෙවැනි නෛතික වියදම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | හිටපු මුදල් අධ්‍යක්ෂ විසින් හිටපු සභාපතිට විරුද්ධව පෞද්ගලිකව ගොනුකර තිබුණු අපහාස නඩුව (DMR/3067/2022 දරන නඩුව) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව රු.මිලියන 0.42 ක නිතිඥ ගාස්තු අධිකාරිය විසින් ගෙවා තිබුණි. | මෙම නඩුවේ පැමිණිල්ල සඳහා හිටපු සභාපතිතුමන් විසින් ගොනු කරන ලද විත්තිකරුගේ පිළිතුරු ප්‍රකාශයේ සඳහන් වනුයේ මෙම නඩුවට පාදකවන හේතුව වූ එකී හිටපු මුදල් අධ්‍යක්ෂගේ සේවය අවසන් කිරීම රාජකාරී කටයුත්තක්වන අතර තමන් විසින් පුද්ගලික මට්ටමින් සිදු කරන ලද ක්‍රියාවක් නොවන බවය. මෙම නඩුව සඳහාද පුද්ගලික නීතිඥවරුන් යොදා ගැනීමටද, ඔවුන්ගේ නීතිඥ ගාස්තු ආයතනය මඟින් ගෙවීමටද කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කොට ඇත. | පෞද්ගලික මට්ටමින් නිලධාරීන්ට එරෙහිව ගොනු කර තිබුණු නඩු සඳහා ආයතනයේ මුදල් වැය කිරීමට අනුමැතිය ලබා දුන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**3.8 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සිදු වූ හදිසි අනතුරු 12 ක් හා සමාලෝචිත වර්ෂයේ සිදු වූ අනතුරු 10 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා 2025 මාර්තු 30 දින දක්වා සකස්කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා සකස් කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සභාපතිවරයා වෙත වෙන්කර දී තිබුණු රථය සඳහා ද සමාලෝචිත වර්ෂය තුළදී හදිසි අනතුරු හතරක් සිදු වී තිබුණු අතර ඉන් අවස්ථා තුනක දී රක්ෂණයෙන් ආවරණය කර ගත නොහැකි වූ අළුත්වැඩියා වියදම රු. 379,059 ක් විය. | සභාපතිතුමාට අනුයුක්ත කර ඇති වාහනය සම්බන්ධයෙන් 2023 හා 2024 වර්ෂවලට අදාළව සිදුවූ හදිසි අනතුරු ලිපිගොනු මුදල් රෙගුලාසි 104 (03) අනුව පරීක්ෂණ පැවැත්වීමේ කමිටුව වෙතට යොමුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කර රක්ෂණය මඟින් ආවරණය කර ගැනීමට නොහැකි වූ අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, (CHPB) සහ (CETRAC) ආයතනවලට අයත් වාහන 50 ක් පවතින අතර ඉන් වාහන 6 ක් ක්‍රියාකාරිත්වයේ නොතිබුණි. අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලද 32-3923 වාහනය පවරාගෙන නොතිබුණි. | අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලද අංක 32-3923 දරන වාහනය පවරාගැනීමට අමාත්‍යාංශය විසින් අදාළ ලේඛන ලබාදී ඇති අතර මේවන විට එම ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ අතර එහිදී CMT 130 පෝරමය පුරවා නැවත මෝටර් රථ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදී ඇත. | අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලද වාහනයේ පවරාගැනීම් කටයුතු කඩිනම් කළ යුතු අතර ක්‍රියාකාරිත්වයේ නොතිබෙන වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක (සහකාර අධ්‍යක්ෂක) තනතුරක් පැවතියද එම තනතුර වසර තුනකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන අංශය සඳහා එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. ප්‍රාදේශීය මට්ටමින් පුහුණු මධ්‍යස්ථාන තුනක්ද සහිතව නිලධාරීන් 189 ක් අධිකාරීයේ සේවය කරනු ලැබුවද එහි අභ්‍යන්තර පාලනය හා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නිසි සමාලෝචනයක් කිරීමට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණි. | රජයේ බඳවා ගැනීම් සීමා කර ඇති බැවින් අධිකාරියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් නවතා තිබුණු අතර බඳවාගැනීම් පටිපාටියේ සංශෝධනයක් සහ තනතුරු සංඛ්‍යාව සංශෝධනයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | බඳවාගැනීමට අදාළ අනුමැතීන් කඩිනමින් ලබා ගෙන අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු පිරවීම තුළින් අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය. |